**ශ්‍රම වාසනා අරමුදල - 2021**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මතය

**------**

ශ්‍රම වාසනා අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගණුදෙනු කළමණාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍යවන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමණාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානු වලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම ආවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත | | | |
| (i) 3 : 3 උප වගන්තිය | පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට, එහි රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරන ආකාරය විධිමත් කර ගැනීම සම්බන්ධව රීති සැදීමට බලය ලබා දී තිබුණත් 2021 දෙසැම්බර් 31 දිනටත් එබඳු රීති පිළියෙල කර නොතිබුණි. | 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව රීති සකස් කිරීමට අදාළ වූ 6(3) හා 3(3) වගන්ති සහ 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ 3.3 (g) (ii) හා 14 වන වගන්ති අනුව රීති සකස් කිරීම වෙනුවෙන් වූ කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රීති, ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර මුදල් අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත. | |
| (ii) 3 : 4 : (2 උ) උප වගන්තිය | කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවෙකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තකයකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබාගැනීමට, මූල්‍යමය සහන සැලසීමට තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට යටත් විය යුතු වුවත්, අදාල රීති 2021 දෙසැම්බර් 31 දිනටත් පිළියෙල කර නොතිබුණි. | 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව රීති සකස් කිරීමට අදාළ වූ 3(3) හා 6(3) වගන්ති සහ 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ 3(3)(g)(ii) හා 14 වන වගන්ති අනුව රීති සකස් කිරීම වෙනුවෙන් වූ කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රීති, ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර අතර මේ වන විට මුදල් අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (iii) 13 : 1 උප වගන්තිය | අරමුදල හා ලොතරැයි මණ්ඩලය එකඟවනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක් හා යම් ලොතරැයි වර්ග අරමුදල වෙනුවෙන් එක් එක් වර්ෂයේදී පවත්වනු ලැබිය යුතු වුවද, අරමුදල විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකගතාවයකට එළඹ නොතිබුණි. | 2017 වර්ෂයේ සිටම ලොතරැයි මණ්ඩලය සමඟ ඇති කර ගත යුතු එකඟතාවයේ කෙටුම්පතක් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර මේ දක්වා වාර්ෂිකව මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශය දැනුවත් කළ ද, ඒ සම්බන්ධයෙන් එකඟතාවක් පළ වී නොමැත.කෙසේ වුවද, මේ පිළිබඳව සාකච්ඡා කිරීමට ඉදිරියේදී අවස්ථාවක් ලබා දෙන බව වාචිකව ප්‍රකාශ කර ඇත.කිහිප අවස්ථාවකම සිහි කැඳවීම් කළද ඊට ප්‍රතිචාරයක් මේ දක්වා ලබා දී නොමැත. | පනත අනුව කටයුතු කලයුතු වීම. |
| (iv) 13 : 2 (අ) උප වගන්තිය | අරමුදල හා ලොතරැයි මණ්ඩලය අතර ඇති කර ගන්නා එකඟවීමට වෙනත් කරුණු අතර, එසේ පවත්වන ලොතරැයිවලදී ප්‍රදානය කරන තෑගි පිළිබඳව, ඒ ලොතරැයිවලදී හිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධව කටයුතු කරන ආකාරය | -එම - | පනත අනුව කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳව, සහ ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් අරමුදල සඳහා වෙන්කල යුතු මුදල් ප්‍රමාණය පිළිබඳව විධිවිධාන ඇතුලත් විය යුතු වුවත්, අරමුදල හා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එවැනි එකඟතාවයන්ට එළඹ නොතිබුණි. | | |
| (v) 14 : 1 උප වගන්තිය | මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය යැයි මණ්ඩලය සලකන රීති හෝ මේ පනත මගින් රීති සෑදීමේදී බලය දී ඇති හෝ රීති සෑදීම අවශ්‍ය යැයි සලකන කාරණා සඳහා රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විටත් එබඳු රීති පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. | මේ පිළිබඳ මුදල් අමාත්‍යාංශය වෙත ගැසට් කිරීම ඉක්මනින් සිදු කර ගැනීම පිළිබඳ 2021 දෙසැම්බර් 30 දිනැති සිහි කැඳවීම් ලිපිය යොමු කර ඇත. | පනත අනුව කටයුතු කළ යුතු වීම. |
| (vi) පනතේ 4(1) (අ) වගන්තිය සහ 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතේ 2 (1) (අ) වගන්තිය | මණ්ඩලයේ සභාපතිවරයා විය යුත්තේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාය. 2020 අගෝස්තු 09 වන දින අංක 2187/27 දරණ ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය අනුව සියලුම අරමුදල් මුදල් අමාත්‍යාංශය යටතට පත් කර ඇති බැවින් අරමුදලේ සභාපතිවරයා විය යුත්තේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාය. එසේ වුවද,භාණ්ඩාගාර ලේකම්වරයාගේ MF1/05/01/178 – SVF/02 අංකය දරණ 2021 ජුනි 02 දිනැති ලිපිය මගින් සභාපතිධූරය සඳහා කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා පත් කිරීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් | 2020 අගෝස්තු 09 වන දින අංක 2187/27 දරණ ජනාධිපති කාර්යාලය මඟින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයේ මුදල් අමාත්‍යාංශය යටතට අයත් ආයතන හා ක්‍රියාත්මක විය යුතු අණ පනත් යටතේද මෙම අරමුදල ඇතුළත් කර ඇති අතර එම ගැසට් පත්‍රයේම කම්කරු අමාත්‍යාංශය යටතේ ද ක්‍රියාත්මක විය යුතු අණ පනත් යටතට පමණක් ශ්‍රම වාසනා අරමුදල් පනත ඇතුළත් කර ඇත.<br>ශ්‍රම වාසනා අරමුදලේ සභාපතිවරයා ඉල්ලා අස්වීම මත MF1/05/01/178-SVF-02 හා 2021 ජුනි 02 වන දින ශ්‍රම වාසනා අරමුදලේ සභාපති ලෙස කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා පත් කළ ලිපිය කම්කරු අමාත්‍යාංශය මඟින් 2021 ජුනි 22 ශ්‍රම වාසනා අරමුදල වෙත ලැබී ඇත. | පනත අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ඒකඟතාවය ලබාදුන් බව දන්වමින් කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා පත් කිරීමට කටයුතු කොට තිබුණි. | | |
| (vii) පනතේ 6(අ) හා 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල සංශෝධන පනතේ 3 (1) වගන්තිය | සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කල යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනටත් සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා දිගුකාලයක් පාසල් වසා දමා ඇති අවස්ථාවක පාසල් උපකරණ ලබා දීම ප්‍රායෝගිකව ඵලදායී නොවන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දුන් උපදෙස් පරිදි වැඩසටහන සිදු නොකිරීමට තීරණය විය. | පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (viii) 6 (ආ) වගන්තිය | සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමුණු අවස්ථාවක, ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම කලයුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට එබඳු මූල්‍ය හා වෙනත් අධාර සපයා නොතිබුණි. | සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමුණු අවස්ථා වලදී ඒ පිළිබඳ තොරතුරු සේවය අවසන් කිරීමේ අංශය මඟින් අදාළ ප්‍රතිලාභීන් වෙත ශ්‍රම වාසනා අරමුදල මඟින් විස්තර හා අයදුම්පත් ලිපි යවා ඔවුන් වෙත දුරකථනය ඔස්සේද දැනුවත් කිරීම සිදු කළ නමුත් ඒ සඳහා ඔවුන්ගෙන් පිළිතුරක් නොලැබී ඇති බව ප්‍රකාශ කරමි. | පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ix) සංශෝධිත පනතේ 3 (3) උ (ii) වගන්තිය | මූල්‍යමය සහන සඳහා තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයට යටත් විය යුතු බව සඳහන් වුවත් 2021 දෙසැම්බර් 31 දිනටත් එබඳු රීති සටහන් කර නොතිබුණි. | 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව රීති සකස් කිරීමට අදාල වූ 3(3) හා 6(3) වගන්ති සහ 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ 3(3)(g)(ii) සහ 14 වන වගන්ති අනුව රීති සකස් කිරීම වෙනුවෙන් වූ කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රීති, ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර මේ වන විට මුදල් අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමු කර ඇත.නීති කෙටුම්පත් සම්පාදක මඟින් මේ වන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (x) සංශෝධිත පනතේ 6 (3) 1 වගන්තිය | ගැසට් පත්‍රයේ පළ කරන ලද රීති සම්බන්ධයෙන් සඳහන් වුවත් 2021 දෙසැම්බර් 31 දිනටත් එබඳු රීති ගැසට් කර | සංශෝධන පනතේ 6(3)(1) වගන්තිය ප්‍රකාරව ගැසට් කිරීමට අවශ්‍ය රීති සැකසීම පිළිබඳව 2021 දෙසැම්බර් 30 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ | පනත අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | නොතිබුණි. | අනුමැතිය ලබා ගෙන ගැසට් පත්‍රය පළ කිරීමට මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇත.තවද මුදල් අමාත්‍යාංශය මඟින් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,140,835 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.12,330,517 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,189,682 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම රු. 3,130,309 කින් අඩු වීම හා වියදම රු. 7,059,373 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඒකාබද්ධ අරමුදලින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු රු.27,502,924 කින් රු.13,000,000 ක් පමණක් ලැබී තිබුණු අතර රු.14,502,924 ක් ලැබිය යුතුව තිබුණි. තවද එම ශේෂය ද ඇතුළත් ලැබිය යුතු ශේෂය රු.346,643,444 ක් 2004 වසරේ සිට ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතුව පවතින අතර එම ශේෂය ඒකාබද්ධ අරමුදලින් අයකර ගැනීමට නිසි පියවරයන් අනුගමනය කර නොතිබුණි. භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි මුදල් ලබාගැනීමට නොහැකි වීම අරමුදලේ අරමුණු ඉටුකරගැනීම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කර තිබුණි. | ජාතික සම්පත ලොතරැයියෙන් ලැබෙන ආදායම ලොතරැයි මණ්ඩලය විසින් ශ්‍රම වාසනා අරමුදල නමින් වූ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබයි.සෑම වර්ෂයක් සඳහාම පිළියෙල කරනු ලබන අයවැය ලේඛණය සහ ක්‍රියාකාරී සැලැස්මට අනුව එහි සඳහන් ප්‍රතිපාදන සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාරයට ලිපි යොමු කිරීම මඟින් ඉල්ලුම් කරයි.<br>2004 වර්ෂයේ සිට ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන මුදල් 2008 වර්ෂය දක්වා චෙක්පත් මඟින් ශ්‍රම වාසනා අරමුදලට කොටස් වශයෙන් ලැබීමට සලස්වා ඇති නමුත් 2009 වසරේ සිට 2014 වසර දක්වා එම මුදල් අරමුදලට ස්ථාවර තැන්පතු ප්‍රමාණය සළකා බලා ලබා දීම නතර කර තිබුණි.2015 සිට මේ දක්වා ඒකාබද්ධ අරමුදලට බැර කර ඇති මුදල් විටින් විට ශ්‍රම වාසනා අරමුදල වෙත භාණ්ඩාගාරය මඟින් ලබා දෙන ලදී. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළ සැලකිය යුතු ප්‍රමාණයක ස්ථාවර තැන්පතු පවත්වා ගෙන යන බැවින් අරමුදලේ මූල්‍යමය කටයුතු | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අරමුදල ලබාගෙන පනතේ අරමුණු ඉටුකර ගැනීමට වැඩපිළිවෙලක් සැකසිය යුතුය. |

| | | |
|---|---|---|
| | කළමණාකරණය කර ගැනීම සඳහා මේ වන විට ශ්‍රම වාසනා අරමුදල සතුව ඇති ස්ථිර තැන්පතුවල මුදල් අවශ්‍ය කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන මෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිපියක් අප වෙත එවා ඇත. | |

**3.2 මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බදුල්ල දිස්ත්‍රික්කයේ වතු කම්කරු ජනතාව (Estate Labour Workers) සඳහා සනීපාරක්ෂක වැසිකිලි 200 ක් ශ්‍රම වාසනා අරමුදලින් ඉදිකිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඇති අරමුදල සතු මුදලින් රු.10,000,000 ක මුදලක් 2021 පෙබරවාරි මාසයේදී ලබාදී තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය තුල රු.5,950,000 ක් බදුල්ල දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රතිලාභීන් වෙත ගෙවීම හා ව්‍යාපෘතියේ අනෙකුත් වියදම් ලෙස රු.234,206 ක් වැයකර තිබුණි. 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතේ සහ 2019 අංක 15 දරණ සංශෝධිත පනතේ අරමුණු අනුව සේවා නියුක්තිකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කලයුතු වුවද, එම අරමුණුවලට බාහිරව අඩු ආදායම්ලාභීන් 140 දෙනෙකු වෙත මෙම වැසිකිලි ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ සලසා දී තිබුණු අතර එය මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාවෙන් සියයට 70 ක් විය. | සෞඛ්‍යාරක්ෂිත වැසිකිළි පහසුකම් නොමැති අඩු ආදායම්ලාභී හා කම්කරු පවුල් ඉලක්ක කර ගනිමින් සනීපාරක්ෂිත වැසිකිළි පහසුකම් ලබාදීමේ නියමු ව්‍යාපෘතියක් වශයෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙසෙන එවැනි පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි 200 ක් ඉදි කිරීමේ කාර්යය වෙනුවෙන් ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය දායකත්වය ලබාදීමේ ඇති හැකියාව සොයා බැලීමෙන් අනතුරුව,ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සැළකිල්ලට ගෙන 2020 දෙසැම්බර් 17 දින පැවති රැස්වීමේදී විශේෂ ව්‍යාපෘතියක් වශයෙන් රුපියල් මිලියන 10 ක මුදලක් භාණ්ඩාගාරය වෙතින් ලබා ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.2020 අග භාගයේදී පිළියෙල කරනු ලැබූ 2021 වර්ෂයට අදාළ මූලික ක්‍රියාකාරී සැලැස්මෙහි මෙම ව්‍යාපෘතිය ඇතුළත් කිරීමට කාලයක් නොතිබුණද,ඉන් අනතුරුව 2020 දෙසැම්බර් මස පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ලබා දුන් අනුමැතිය ප්‍රකාරව 2021 ක්‍රියාකාරී සැලැස්මට එම ව්‍යාපෘතිය ඇතුළත් කර ඇත. එසේම 2021 දෙසැම්බර් 09 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ද 2021 වර්ෂය සඳහා වූ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම තුළ අඩු ආදායම්ලාභී හා කම්කරු සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණට අදාළ විශේෂ ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නැවත වරක් ආවරණ අනුමැතියද ලබා දී ඇත. | පනතේ විධිවිධාන අනුව සුබසාධන කටයුතු සිදුකළ යුතුය. |